සැ. යු. - 2011.06.10 දින පළ වූ අංක 1710 දරන ගැසට් පත්‍රයේ III සහ IV (අ) කොටස් පළ නොවීය.
මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,711 - 2011 ජුනි මස 17 වැනි සිකුරාදා - 2011.06.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 966 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | 968 |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 976 |


සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 ජුනි මස 24 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 ජුනි මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂ්මන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ වත්තේගම නගර සභාව
## ට්‍රැක්ටර් රියදුරු/මාර්ග කම්කරු/(කොන්ත්‍රාත් පදනම) තනතුරු සඳහා බඳවා ගැනීම

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ, වත්තේගම නගර සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ස්ථිර පදිංචිය ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව සකස් කළ අයදුම්පත් 2011.06.30 දිනට පෙර "ලේකම්, වත්තේගම නගර සභාව, වත්තේගම" ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහා එවන කවරයේ වම් කෙළවර ඉහළ කොටසේ ඉල්ලුම්කරන තනතුර සඳහන් කළ යුතුය. (වත්තේගම නගර සභාවේ දැනටමත් සේවයේ නියුතු ස්ථිර/ අනියම්/ ආදේශක සේවකයින්ට ප්‍රමුඛතාවය දක්වනු ලැබේ.)

| තනතුරු නාමය | පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|
| ට්‍රැක්ටර් රියදුරු III පන්තිය | 01 | 06/2006 iv-PL3<br>රු.12,470-130x10-145x10-160x10-170,x12 -රු. 18,860 | අ.පොස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල/දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් හයකින් සාමාර්ථ ලබා තිබිය යුතුය. |
| මාර්ග කම්කරු (කොන්ත්‍රාත් පදනම) | 03 | 06/2006 iv-PL1<br>රු.13,060-130x10-145x10-160x12-රු.17,600 | අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල/දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් හයකින් සාමාර්ථ ලබා තිබිය යුතු ය. |

*පොදු සුදුසුකම් (රියදුරු/මාර්ග කම්කරු) :*

1. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)
2. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකික විය යුතුය.
3. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.
4. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ යටත් පිරිසෙයින් වසර 03 ට නොඅඩු කාලයක් ස්ථිර පදිංචිය ඇති අයෙක් විය යුතුය. (ඡන්ද හිමි නාමලේඛනයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතුය.)

*ට්‍රැක්ටර් රියදුරන් බඳවා ගැනීමේ ක්‍රමය :*

1. සුදුසුකම් සපුරා ඇති අයැදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයට පෙනී සිටිය යුතුය.
2. ලිඛිත පරීක්ෂණයෙන් සමත්වන්නා වූ අයදුම්කරුවන් පත්කිරීමට පෙර මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් මෝටර් වාහන පරීක්ෂකවරයෙකු හා පොලිස් රථ වාහන අංශයේ නිලධාරියෙකුගෙන් ද සමන්විත තිදෙනෙකුට නොඅඩු මණ්ඩලයක් මගින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ වෘත්තීය පරීක්ෂණයෙන් සමත් විය යුතුය.
3. සේවයට බඳවා ගැනීම අදාළ පළාත් පාලන ආයතනයේ පත්වීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

*ට්‍රැක්ටර් රියැදුරන් බඳවා ගැනීමේ වෙනත් සුදුසුකම් :*

1. අවම උස අඩි 5 අඟල් 2.5ක් විය යුතුය.
2. දිවා කාලයේ දී සහ රාත්‍රි කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්වයක් තිබිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය.

*ට්‍රැක්ටර් රියදුරන් සඳහා වෘත්තීය සුදුසුකම් :*

1. රියදුරු III ඛණ්ඩයට බඳවා ගැනීමේ දී පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොණ්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබාසිටිය යුතුය. (වලංගු බර වාහන රියදුරු බලපත්‍රයක් විය යුතු අතර, බඳවා ගන්නා දිනට වසර 03කට පෙර අදාළ සහතිකය ලබා සිටිය යුතුය. වාහන පන්ති පීසහ ජී 1 සමඟ)

*ට්‍රැක්ටර් රියදුරන් සඳහා සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

- මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය.
- එසේම රාජ්‍ය සේවා පත්කිරීම් ආදළ වන පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.
- තෝරාගනු ලබන්නන් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වන අතර, එම කාලය තුළ වැඩ, හැසිරීම, පැමිණීම සතුටුදායක තත්ත්වයක නොමැති වුවහොත් සේවයෙන් ඉවත් කරනු ලැබේ.

*මාර්ග කම්කරුවන් සඳහා සුදුසුකම් :*

- මාර්ග කම්කරු රාජකාරි ඉටු කිරීම සඳහා සුදුසු ශාරීරික යෝග්‍යතාවයක් තිබිය යුතුය.

*මාර්ග කම්කරු සඳහා සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

- මෙම තනතුරු කොන්ත්‍රාත් පදනම මතය. විශ්‍රාම වැටුප් රහිතය.

*අයදුම් කළ යුතු ආකාරය සහ පොදු කොන්දේසි :*

- විශිෂ්ඨ චරිතයකින් සහ මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය. තෝරා ගනු ලැබුවහොත් මාසයක් ඇතුළත රජයේ වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, එම පරීක්ෂණයේ දී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

- රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතු අතර, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතු ය.

- රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූ අයදුම්කරුවන් අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනට පූර්වාසන්න වන අවුරුදු 05ක කාලය තුළ වරදකට (අවවාද කිරීම හැර) වූ ද, මෙම කාලය තුළ යෙදුණු වැටුප් වර්ධක නිශ්චිත දිනට ලබාගත්තා වූ ද, සතුටුදායක සේවා කාලයක් තිබිය යුතු ය. තෝරාගනු ලැබුවහොත් ඔවුන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට තවදුරටත් දායක විය යුතු ය.

- වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධාන අනුව අයදුම්කරු ත්‍රිවිධ හමුදාව හා ආරක්ෂක සේවයේ නිරත වී සිටියේ නම් විධිමත් පරිදි සේවයෙන් මුදා හරිනු ලැබූ අයෙකු විය යුතු ය. (අදාල ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.)

- මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද, මධ්‍යම පළාත් සභාව හෝ වත්තේගම නගර සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝග වලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.

*අයදුම් කළ යුතු ආකාරය* .- මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර පහත සඳහන් සහතිකවල ඡායාස්ථ පිටපත් සමග 2011.06. දිනට ප්‍රථම මා වෙත ලැබීමට සලස්වන්න.

1. උප්පැන්න සහතිකය
2. අධ්‍යාපන සහතික
3. පදිංචිය පිළිබඳව ග්‍රාම නිලධාරි සහතිකය( ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කළ යුතුය.)
4. මෑතක දී ලබාගත් චරිත සහතිකය

ලේකම්,
වත්තේගම නගර සභාව.

2011 මැයි මස 20 වැනි දින,

ආදර්ශ අයදුම්පත්‍රය

**මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම**
**වත්තේගම නගර සභාව**

**............................................ *තනතුර සඳහා වන ආදර්ශ අයදුම්පත්‍රය***

01. මුලකුරු සමග නම :—————.
    මුලකුරුවලින් හැඳින්වෙන නම් :—————.
02. ස්ථිර ලිපිනය :—————.
03. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :—————.
04. ජාතික හැඳුනුම්පත් අංකය :—————.
05. උපන් දිනය: වර්ෂය:—————. මාසය:—————. දිනය :—————.
06. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස :—————.
07. ස්ත්‍රී/පුරුෂ භාවය :—————.
08. විවාහක/අවිවාහක බව :—————.
09. ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන්නේ උපතින් ද ලියාපදිංචි වීමෙන් ද යන වග :—————.
10. අධ්‍යාපන සුදුසුකම්(සහතික වල පිටපත් ඇමිණිය යුතුය.) :—————.
    අ.පො.ස. (සා. පෙළ) විභාගය
    සමත් වර්ෂය :—————. විභාග අංකය :—————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| *1.* | | *5.* | |
| *2.* | | *6.* | |
| *3.* | | *7.* | |
| *4.* | | *8.* | |

11. (1) වෙනත් අධ්‍යාපන සුදුසුකම් :—————.
(2) වෘත්තීය සුදුසුකම් :—————.
(3) සේවා පළපුරුද්ද :—————.
12. ඔබ දැනටමත් මෙම නගර සභාවේ සේවයේ නියුක්තව සිටින්නේ නම් දැනට දරන තනතුර :—————.
ස්ථිර/අනියම්/තාවකාලික/කොන්ත්‍රාත් ආදේශක ද යන වග :—————.
එම තනතුරට පත්වූ දිනය :—————.

13. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ? :—————.

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සෙකු වන බව හා පත්වීම ලැබීමෙන් පසුව එය ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් ද රහිතව සේවයෙන් පහ කිරීමට යටත් වන බව ද දනිමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

***දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය***

මෙම ඉල්ලුම්කරු/ඉල්ලුම්කාරිය වන .............................................. මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ ......................................... වශයෙන් සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරාගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

—————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :—————.
අත්සන :—————.
(නිලමුද්‍රාව තැබිය යුතුය.)

06-224

# අතුරු ව්‍යවස්ථා

**1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත**
**කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව**

261 වැනි අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව විසින් 2010.11.30 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2011 මැයි මස 26 වැනි දින,

සභාපති,
කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව.

**යෝජනාව**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු 261 වැනි අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (02) වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ වයඹ පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වයඹ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2010.07.16 දින අංක 1663 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* iv (අ) කොටසේ පළ කරනු ලැබූ වයඹ පළාතේ පළාත් සභාව විසින් ස්ථිර කරන ලද 2011.04.28 අංක 1703/18 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* iv(අ) කොටසේ පළ කරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත්කරන ලද්දා වූ ද ප්‍රාදේශීය සභාවල අප්‍රසන්න, අන්තරාදායක සහ අප්‍රසන්න, අන්තරාදායක

වෙළඳාම් කටයුතු සංචාරක වෙළඳාම, ප්‍රාදේශීය සභා සීමාව තුළ මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම, ප්‍රාදේශීය සභා සීමාව තුළ පාරවල් සහ මංමාවත් සැරසිළි කිරීම, ලැගුම් නිවාස හා නවාතැන් පොළවල් පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට ක්‍රියාත්මක කිරීමට පිළිගැනීමට ඉහත කී පළාත් පාලන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ (1) උප වගන්තියේ යටතේ කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

වයඹ පළාතේ පළාත් සභාව

අතුරු ව්‍යවස්ථාව

*1957 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත) අතුරු ව්‍යවස්ථා පනත*

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ වයඹ පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වන ම විසින් සාදනු ලැබ මෙහි පහත දක්වා ඇති කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

එකී කෙටුම්පත් අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධාන අඩංගු අතුරු ව්‍යවස්ථා සෑදීම 1897 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය සමග කියවිය යුතු 126 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභා වලට බලය ලැබී ඇති අතර, එම අතුරු ව්‍යවස්ථා ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ (03) වැනි උප වගන්තියේ විධිවිධාන වලට යටත්ව පිළිගැනීමට ප්‍රාදේශීය සභාවලට බලය දෙමි.

*යෝජනාව :-*

2010.11.30 වැනි දින කොබෙයිගනේ ප්‍රාදේශීය සභා මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේ දී පැවති මාසික මහ සභා රැස්වීමේ දී යෝජනා සම්මත කරගත් පරිදි ප්‍රධාන ඇමතිතුමා වයඹ පළාත් සභාව තුළ ක්‍රියාත්මක කිරීමට සම්මත කරගත් අතුරු ව්‍යවස්ථා 06න් 05ක් අප ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමටත්, එය වැළඳ ගැනීමටත්, සභාව යෝජනා කරන්නීය.

ප්‍රධාන අමාත්‍ය,
අතුල සරත් කුමාර විජේසිංහ,
(ප්‍රධාන අමාත්‍ය හා මුදල් ක්‍රම
සම්පාදන නීතිය හා සාමය,
පළාත් පාලන, පළාත් පරිපාලනය,
මිනිස්බල අධ්‍යාපන හා
සංස්කෘතික කටයුතු,
පරිසර, නිවාස හා ඉදිකිරීම් කර්මාන්ත
හා ග්‍රාමීය කර්මාන්ත සහ
වනිතා කටයුතු අමාත්‍යාංශය.)

වයඹ පළාත් සභාව

සංචාරක වෙළඳාම සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව

01. මෙම අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන් තුළ සංචාරක වෙළඳාම විධිමත් කිරීම පාලනය කිරීම හා පරිපාලනය කිරීම සඳහා පනවනු ලැබේ.

02. මෙම අතුරු ව්‍යවස්ථාව අනුව කොබෙයිගනේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ඔහුගේ බලයලත් නිලධාරියෙකු විසින් නිකුත් කරනු ලබන සංචාරක වෙළඳාම බලපත්‍රය හා අයදුම්පතක් සතුව ඇත්නම් මිස කොබෙයිගනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සංචාරක වෙළෙන්දෙකු වශයෙන් වෙළඳ කටයුතුවල යෙදීම නොකළ යුතුය.

03. මෙහි දෙවන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් සංචාරක වෙළඳ බලපත්‍රය අංක 02 උපලේඛනයට සාරානුකූල විය යුතු අතර, ඒ සඳහා අංක 01 උප ලේඛනය ප්‍රකාර අයදුම්පත්‍රයක් ඉදිරිපත් කළ යුතුය.

04. 1. ඉහත 02 වැනි අතුරු ව්‍යවස්ථාව ප්‍රකාර ලබාගන්නා සෑම බපත්‍රයක් ම කළින් අවලංගු කළහොත් මිස ලබාගත් වර්ෂයේ දෙසැම්බර් 31 වැනි දින දක්වා බල පවත්වන්නේය. මෙසේ නිකුත් කරනු ලබන බලපත්‍රය මෙම අතුරු ව්‍යවස්ථා විධිවිධාන කඩ කිරීම හේතු කොට ඕනෑම අවස්ථාවක අවලංගු කිරීමේ බලය හා නැවත බලපත්‍රය නිකුත් කිරීමේ බලය බලධාරියා සතු වන්නේය.

11. සීමිත කාලයක් සඳහා නිකුත් කරනු ලබන තාවකාලික බලපත්‍රය එම බලපත්‍රයේ සඳහන් කාල පරිච්ඡේදය සඳහා පමණක් වලංගු වන්නේය.

05. කුමන හේතුවක් නිසා හෝ ඉහත 2 වැනි අතුරු ව්‍යවස්ථා ප්‍රකාර ලබාගන්නා බලපත්‍ර හා හැඳුනුම්පත්‍ර අන් සතු නොකළ යුත්තේය.

06. සෑම සංචාරක වෙළන්දෙක්ම ව්‍යාපාරික කටයුතුවල නිරත වී සිටින වේලාවන්හිදී සභාපතිවරයා විසින් නිකුත් කර ඇති හැඳුනුම්පත පැහැදිලිව පෙනෙන සේ පැළඳිය යුතුය.

07. නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයකටම සුදුසුයැයි අදහස් කරනු ලබන කොන්දේසි ඇතුළත් කිරීමට සභාපතිවරයාට බලය ඇත.

08. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍ර ලබාගැනීම සඳහා සභාව විසින් කලින් කල යෝජනා සම්මුතීන් මගින් නියම කරනු ලබන ගාස්තු ප්‍රමාණයන් අනුව ගාස්තුවක් ගෙවනු ලැබිය යුතුය.

09. බලපත්‍ර ලත් සෑම සංචාරක වෙළෙන්දෙකුම සංචාරක වෙළඳ කටයුතු පෙ.ව. 6.00 සිට ප.ව. 10.00 අතර කාල සීමාවක් තුළ කළ යුතුය. එසේ වුවද, විශේෂ උත්සව අවස්ථාවන්හිදී මෙම කාල සීමාවන් සභාපතිවරයා විසින් ලිහිල් කරනු ලැබිය හැකිය.

10. කිසිම බලපත්‍රධාරියෙකු හෝ ඔහුගේ නියෝජිතයෙක් වෙළඳ කාල සීමාවෙන් බැහැරව සංචාරක වෙළඳ කුටිය තුළ හෝ අසළ නේවාසිකව ගත නොකළ යුතුය.

11. සංචාරක වෙළඳ කුටි භාවිතා කරන්නේ නම් එකී වෙළඳ කුටි තුළ හෝ ඒ අවට කිසිදු ආකාරයක ආහාර පිසීමක් හෝ පිළියෙල කිරීමක් නොකළ යුතුය.

12. සංචාරක වෙළඳාමේ දී ආහාරපාන විකිණීම කරනු ලබයි නම්, සියලු ආහාරපාන වර්ග සෞඛ්‍ය ආරක්ෂිත ලෙස ආවරණය කර තබා විකිණිය යුතු අතර, ආහාරපාන ගැනීම සඳහා සුදුසු වන හැඳි ආදී උපකරණ භාවිතා කළ යුතුය. එසේම ආහාර පනතේ විධිවිධානවලට අනුකූලව සිය වෙළඳාම කළ යුතුය.

13. ගෝඝාතක ආඥා පනතේ සඳහන් කර ඇති සතුන්ගේ මස් නොවිකිණීම නොකළ යුතුය.

14. බලපත්‍ර ලාභියා බෝවන රෝගයකින් පෙළෙන්නේ නම්, ව්‍යාපාරික කටයුතුවල යෙදීමෙන් වැළකිය යුතු අතර, ඒ සඳහා බෝවන රෝගයකින් පෙළෙන අයෙකු නොයෙදවිය යුතුය.

15. සංචාරක වෙළෙන්දෙකු විසින් කිසියම් බෝවන රෝගයක් පැතිරෙමින් පවතින හෝ පැතිර ඇති ප්‍රදේශයක පිළියෙල කරන ලද ආහාර

ද්‍රව්‍ය හෝ වෙනත් ද්‍රව්‍ය විකුණනු ලැබීම සභාපතිවරයා විසින් තහනම් කල යුතුය.

16. අපද්‍රව්‍ය හෝ අපජලය පොදු ස්ථානවල නොදැමිය යුතු අතර, ඒ සඳහා සභාපතිවරයා සෑහීමකට පත් වන ආකාරයකට නිසි විධිවිධාන සලසා තිබිය යුතුය.

17. සංචාරක වෙළඳාම නිසා ජනනය වන කසළ හා අපද්‍රව්‍ය හා අප ජලය බැහැරලීම සඳහා සභාවේ එකඟතාවය පරිදි ක්‍රමානුකූල වැඩ පිළිවෙලක් සංචාරක වෙළෙන්දා විසින්ම සකස් කොට අනුගමනය කළ යුතුය.

18. ප්‍රාදේශීය සභාවේ බලයලත් නිලධාරියෙකු ඉල්ලා සිටි විටකදී සිය බලපත්‍රය හා හැඳුනුම්පත්‍රය බලපත්‍රධාරියා විසින් ඉදිරිපත් කළ යුතුය.

19. පොදු වෙළඳපොල පරිශ්‍රය තුළ සංචාරක වෙළඳාම තහනම්ය. කිසියම් ස්ථානයක දීර්ඝ වේලාවක් රැඳී සිට වෙළඳාම් කිරීම නොකළ යුතුය.

20. නිසි අධිකරණයක් මගින් බලපත්‍රයක් අවලංගු කරනු ලැබූ විට යථෝක්ත බලපත්‍රය නොපමාව සභාපතිවරයා වෙත ආපසු භාරදිය යුතුය.

21. සංචාරක වෙළඳ බලපත්‍රය හා සභාව විසින් නිකුත් කරනු ලබන හැඳුනුම්පත්‍රයක් නොමැති විට හෝ මෙම අතුරු ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීම සම්බන්ධව ප්‍රාදේශීය සභා පනතේ 122 (02) වගන්තිය යටතේ කටයුතු කිරීම නිත්‍යානුකූල වන්නේය.

*මෙහි පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස -*

"බලයලත් නිලධාරියා" යන්නෙන් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පැවරූ සභාවේ නිලධාරියෙකු ද,

"සංචාරක වෙළඳාම" යන්නෙන් සභා බල ප්‍රදේශය තුළ ඇවිද හා පාපැදියකින්, යතුරු පැදියකින්, මෝටර් වාහනයකින්, කරත්තයකින් රෝද සවි කර ඇති වෙළඳ කුටියකින් හෝ සිවුපාවෙකු සහාය කර ගනිමින් කරනු ලබන වෙළඳාම ද,

"සභාව" යන්නෙන් අදාළ ප්‍රාදේශීය සභාව ද,

"සභාපතිවරයා" යන්නෙන් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද අදහස්වේ.

***01 වැනි උපලේඛනය :-***

*සංචාරක වෙළඳ බලපත්‍රය :-*

සීමාව තුළ පහත කොන්දේසි ඉටු කිරීමට යටත්ව පහත විස්තර සඳහන් අයට සංචාරක වෙළඳාමේ යෙදීමට මෙම බලපත්‍රය නිකුත් කරනු ලැබේ.

01. සම්පූර්ණ නම :-
02. ලිපිනය :-
03. ජාතික හැඳුනුම්පත් අංකය :-
04. කරනු ලබන වෙළඳාම :-
05. වෙළඳාම කරන සීමාව :-
06. ගෙවන මුදල :- දිනය :- බිල් අංකය :-
07. බලපත්‍රයේ අංකය :-

*කොන්දේසි :-*

01. නිල ඇඳුමක් පැළඳීම
02. මහජනයාට ප්‍රදර්ශණය වන ලෙස හැඳුනුම්පත් පැළඳීම
03. මත්පැන්, දුම්වැටි භාවිතයෙන් තොරවීම
04. ඇතුල්වීම දොරටු හා පඩිපෙලවලට වෙළඳාම් නොකිරීම
05. විනීතව සහ විනයගරුකව හැසිරීම
06. මගීන් විසින් ඉවතලන දෑ කසළ බඳුන්වලට දැමීම
07. මාසික වෙළඳ ගාස්තුව 10 වන දිනට පෙර ගෙවීම
08. වෙළඳ භාණ්ඩ වන පිහියා වැනි ආයුධ මහජනයාට ප්‍රදර්ශනය වන ආකාරයට භාවිත නොකළ යුතුය. (ඉහත කොන්දේසි කඩ කිරීම හෝ නියමිත කාලය තුළ මුදල් ගෙවීමෙන් වැළකීම, බලපත්‍රය අවලංගු කිරීමට හේතුවේ.)

***02 වන උපලේඛනය***

සංචාරක වෙළෙන්දෙකු වශයෙන් ලියාපදිංචි වීමේ ඉල්ලුම්පත්‍රය

01. සම්පූර්ණ නම :-
02. ලිපිනය :-
03. ජාතික හැඳුනුම්පත් අංකය :-
04. කරනු ලබන වෙළඳාම :-
05. සංචාරක වෙළඳාමේ යෙදී ඇති කාල සීමාව :-
06. පැරණි වෙළඳ හැඳුනුම්පත්/බලපත්‍ර අංකය :-
07. නගර සීමාව තුළ ස්ථිර කඩ වලට හිමිකමක් තිබේ නම් කඩ අංකය හා වරිපනම් අංකය :-

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බව සහතික කරන අතර, ප්‍රාදේශීය සභා/නගර සභා විසින් විකිණීමට අවසර නොදෙන ද්‍රව්‍ය අලෙවි නොකරන බවටත්, කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව/නගර සභාව විසින් ගනු ලබන තීරණවලට අනුව කටයුතු කරන බවටත්, සංචාරක වෙළෙන්දෙකු වශයෙන් ලියාපදිංචි වීමේ අවසරය, අයිතිවාසිකමක් ලෙස නොසලකන බවටත්, එකඟතාවයකට යටත්ව සංචාරක වෙළෙන්දෙකු වශයෙන් ලියාපදිංචි කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිමි.

අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

**වයඹ පළාතේ පළාත් සභාව**

**ප්‍රාදේශීය සභා සීමාව තුළ වාහන නවතා තැබීම**

01. මෙම අතුරු ව්‍යවස්ථාව කොබෙයිගනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඇතුළත වාහන නතර කර තැබීමේ පොදු ස්ථාන ඇති කිරීම හා එම ස්ථානවල වාහන නවතා තැබීම විධිමත් කිරීම, පාලනය කිරීම හා පරිපාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

02\. 1. මෙහි මින් මතු "සභාපතිවරයා" වශයෙන් හඳුන්වනු ලබන කොබෙයිගනේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් තම බල ප්‍රදේශය ඇතුළත වාහන නතර කර තැබීම සම්බන්ධව සුදුසු ස්ථාන ප්‍රකාශයට පත් කිරීම නතර කරනු ලැබිය හැකිය.

2. ආරක්ෂක හේතූන් මත හෝ වෙනත් හේතූන් මත වාහන නතර කර රඳවා තැබීම තහනම් ස්ථානයක් බවට පැහැදිලිව දිස්වන ආකාරයට ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීමක් මගින් වාහන නතර කර නොහැකි ස්ථාන ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකිය.

03.2.2 අතුරු ව්‍යවස්ථාවේ දක්වා ඇති දැන්වීමක් මගින් වාහන නතර කර රඳවා තැබීම තහනම් කරනු ලබන ස්ථානයක වාහනයක රියදුරු විසින්,

අ. නිසි බලධාරියෙකු හෝ බලධාරයෙකු විසින් එම වීදියේ හෝ මාර්ගයේ හෝ ඉදි කරනු ලැබ ඇති ප්‍රදර්ශණ කරනු ලැබ ඇති කිසියම් වාහන සංඥාවකට හෝ දැන්වීමකට අනුකූලව ක්‍රියා කිරීමේ හෝ

ආ. එම වීදියේ හෝ මාර්ගයේ හෝ ඒ අවස්ථාවේ පවත්නා ගමනාගමනයක පිළිවෙල නිසි පරිදි අනුගමනය කිරීම හෝ,

ඇ. කිසියම් තැනැත්තෙකුට එම වාහනයෙන් බැසීමට හෝ එම වාහනයට ගොඩවීමට ඉඩ දීම හෝ,

ඈ. එම වාහනයට බඩු පැටවීමේ හෝ එම වාහනයෙන් බඩුබෑමේ හෝ,
කාර්යයන් සඳහා අවශ්‍ය කාලයක් හැර එම වාහනය වීදියේ හෝ මාර්ගයේ නතර කර තැබීම නොකල යුතුය.

04. සභාපතිවරයා හෝ ලේකම්වරයා විසින් මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරනු ලබන වලංගු අවසර පත්‍රයක් තමා සන්තකයෙහි ඇතිනම්, මිස කිසිම තැනැත්තෙකු විසින් වාහන නතර කර තැබීම සඳහා වෙන් කර ඇති ස්ථානයක වාහනයක් නවතා තැබීම නොකළ යුතුය.

05. ඉහත 04 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් පරිදි නිකුත් කරන ලද අවසර පත්‍ර සඳහා සභා සම්මුතියෙන් අනුමත කර ප්‍රසිද්ධ කරනු ලැබූ ගාස්තුවක් අයකරනු ලැබිය හැකිය.

06. ඉහත අංක 04 වන අතුරු ව්‍යවස්ථාවේ අවසර පත්‍රයක් අවස්ථාවෝචිත පරිදි රජයේ දෙපාර්තමේන්තුවක්, සංස්ථාවක් හෝ සංස්ථාගත වූ පුද්ගල මණ්ඩලයක් විසින් සභාව කළින් කළට නියම කරනු ලබන මාසික ගාස්තුවක් ප්‍රාදේශීය සභාව වෙත ගෙවනු ලැබීමෙන් ඒ දෙපාර්තමේන්තුවට, සංස්ථාවට, හෝ පුද්ගල මණ්ඩලයකට අයත් මෝටර් වාහන සඳහා මාසික හෝ වාර්ෂික අවසර පත්‍රයක් ලබාගත හැකිය.

07. ඉහත අතුරු ව්‍යවස්ථා යටතේ අවසර පත්‍රයක් ලබා ගන්නා සෑම තැනැත්තෙකු විසින්ම එම අවසර පත්‍රය වාහනයෙන් පිටතට පැහැදිලිව පෙනෙන පරිදි වාහනය තුළ රඳවා තැබීමට කටයුතු කළ යුතුය.

08. කිසියම් වාහන නතර කර තැබීමේ පොදු ස්ථානයක්, කිසියම් නිශ්චිත පන්තියක, හෝ වර්ගයක හෝ මෝටර් වාහන සඳහා වෙන් කරනු ලැබ ඇති අවස්ථාවක කිසිම තැනැත්තෙකු විසින් එම පන්තියට හෝ වර්ගයට අයත් නොවන වෙනත් මෝටර් වාහනයක් එහි නතර කර තැබීම නොකළ යුතුය.

09. වාහන නතර කර තැබීමේ පොදු ස්ථානයකට ඇතුළුවන හෝ ඉන් පිටව යන හෝ වෙනත් මෝටර් වාහනයකට බාධාවන ආකාරයට කිසිම තැනැත්තෙක් විසින් වාහන නතර කර තැබීමේ ස්ථානයක මෝටර් වාහනයක් එහි නතර කර තැබීම නොකළ යුතුය.

10. අවසර පත්‍රයේ නිශ්චිතව සඳහන් කර ඇති කාල වේලාවන් හැර වෙනත් කාල සීමාවන් තුළ වාහනය නවතා තැබීම නොකළ යුතුය.

11. අවසර පත්‍රය දරන්නා විසින් තම වාහනය නවතා තැබීමේ දී වෙනත් කිසිදු පුද්ගලයෙකුට හෝ පොදු දේපලකට හෝ පුද්ගලික දේපලකට අවහිර නොවන පරිදි සභාව විසින් නියම කරනු ලබන ආකාරයට වාහනය නවතා තැබීම කළ යුතුය.

12. 1. වාහන නතර කර ගැනීමේ පොදු ස්ථානයක ඇති වාහනයක් ඉවත් කර ගැනීම සඳහා අත්‍යාවශ්‍ය වන්නාවූ අළුත්වැඩියාවක් මිස එවැනි ස්ථානයක මෝටර් වාහනයක් අළුත්වැඩියා නොකළ යුතුය.

2. වාහනය නවතා තබන ස්ථානයේ සාමය කඩ කරන ආකාරයේ යම් ක්‍රියාවක් හෝ සදාචාරයට හානි විය හැකි ක්‍රියාවක් කිරීමෙන් වැළකිය යුතුය.

3. වාහන නවතා තැබීමේ පොදු ස්ථානයක් තුළ නවතා ඇති වාහනවලින් අසාමාන්‍ය ශබ්ද පිටවන ආකාරයෙන් වාහන ඇන්ජිම පණ ගැන්වීම නොකළ යුතුය.

4. මෝටර් වාහන නතර කර තැබීමේ පොදු ස්ථානය මෝටර් වාහනයක් නතර කර තිබියදී කිසිම තැනැත්තෙකු විසින් එම වාහනය සේදීම හෝ සේදීමට සැලැස්වීම හෝ නොකල යුතුය.

13. පොලිස් නිලධාරියෙකු හෝ රථ වාහන පාලන හෝ වාහන නතර කර තැබීමේ පොදු ස්ථානයක නතර කර ඇති යම් මෝටර් වාහනයක අයිතිකරුගෙන් නැතහොත්, රියදුරුගෙන් එම මෝටර් වාහනය වෙනුවෙන් නිකුත් කර ඇති වාහන නවතා තැබීමේ අවසර පත්‍රය පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබූ කිනම් අවස්ථාවක වුවද, ඒ අවසර පත්‍රය එම අයිතිකරු හෝ රියදුරු විසින් ඉදිරිපත් කළ යුතුය.

14. යම් නාගරික ප්‍රදේශයක හෝ මහජනතාව රැස්වන යම් නිශ්චිත ස්ථානයක කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව විසින් සම්මත කරන මායිම් ඇතුළත වූ යම් වීථියක හෝ මාවතක, වාහන නවතා රඳවා තබන කාල සීමාව පාලනය කිරීමේ අරමුණින් එසේ නවතා රඳවා තබන කාල ප්‍රමාණය අනුව සභාව විසින් සම්මත කර ගන්නා ගාස්තු ප්‍රමාණයක් අයකර ගත හැකි වන්නේය.

15. කොබෙයිගනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත ඇති යම් මාවතක හෝ වීථියක හෝ ආදායමක් උපයා ගැනීමේ අරමුණ ඇතිව රඳවා ඇති යම් වාහනයකින් සභාව විසින් කළින් කළ සම්මත කර ගන්නා පරිදි යම් ගාස්තුව ප්‍රමාණයක් අයකර ගත හැකි වන්නේය.

16. අවසර පත්‍රයක් ලබාගෙන ත්‍රී රෝද රථ නතර කර තැබීමට කටයුතු කරන අවස්ථාවලදී එම අවසර පත්‍රයේ සඳහන් වන වාහන නතර කිරීමේ ස්ථානයක හැර සභාව විසින් නම් කරනු ඇති වෙනත් නතර කිරීම් ස්ථානයක ත්‍රී රෝද රථය නතර කර තැබීම නොකළ යුතුය.

17. වාහන නතර කර තැබීම සඳහා වන පොදු ස්ථානයක කුළී මුදලක් අපේක්ෂාවෙන් ධාවනය කිරීම සඳහා නවතා තබන ත්‍රී රෝද රථ සඳහා පහත සඳහන් කොන්දේසි හා නියමයන් අදාළ විය යුතුවේ.

1. 04 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් අවසර පත්‍රයක් අයදුම්කරන අය ත්‍රී රෝද රථයේ හිමිකරු නොවේ නම් අයදුම්කරු වෙත අවසර පත්‍රය නිකුත් කිරීම සම්බන්ධයෙන් ත්‍රීරෝද රථයේ හිමිකරුගේ එකගතාවය කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

2. අවසර පත්‍රයේ නිශ්චිතව සඳහන් කර ඇති ස්ථානයේ හැර වෙනත් කිසිදු ස්ථානයක ත්‍රී රෝද රථය කුළී ගමන් අපේක්ෂාවෙන් නවතා තැබීම නොකළ යුතුය.

3. කුළී ගමන් ලබා ගැනීම අනන්‍යතා එකඟතාව මත සිදු කළ හැකිය. ඒ සම්බන්ධව ඔවුනට එකඟතාවකට එළඹීමට නොහැකි වන්නේ නම් සභාපති විසින් ලබාදෙන උපදෙස් මත කුළී ගමන් ලබාගැනීම කළ යුතුවේ.

18. මෙම අතුරු ව්‍යවස්ථාව සෑම දිනකම පෙ.ව. 6.00 සිට ප.ව. 8.00 දක්වා වූ කාලය තුළ වලංගු වන්නේය.

19. මෙම අතුරු ව්‍යවස්ථාව කඩ කරනු ලබන පුද්ගලයින්ට ප්‍රාදේශීය සභා පනතේ 122 (02) වැනි වගන්තිය ප්‍රකාර දඬුවම් නියම කිරීම කළ යුතුය.

මෙම කාල සීමාවන් හා ගාස්තු සභාපතිවරයා විසින් සභා අනුමැතියෙන් පසු සංශෝධනය කිරීමේ අවකාශ ඇති අතර, එහි සංශෝධනයන් ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කළ යුතුය.

*පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස :-*

මෙම අතුරු ව්‍යවස්ථාවේ ''සභාපතිවරයා'' යන්නෙන් අදාළ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද

''ප්‍රාදේශීය සභාව'' යන්නෙන් අදාළ ප්‍රාදේශීය සභාව ද,

''පොලිස් නිලධාරියා'' යන්නෙන් පොලිස් නිල ඇඳුමෙන් සැරසුන ශ්‍රී ලංකා පොලිස් සේවයේ පොලිස් නිලධාරියෙකු ද,

''*මෝටර් වාහනයක්*''යන්නෙන් වාහන නවතා තැබීම සම්බන්ධව විධිමත් පාලනයක් පවත්වා ගැනීමේ කාර්යය සඳහා සභාපතිවරයා හෝ ලේකම්වරයා විසින් පනවනු ලබන සියලු රාජකාරි ඉටු කිරීමට පත් කරන ලද කොබෙයිගනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ නිලධාරියෙකු හෝ සේවකයෙකු ද,

''ලේකම්'' යන්නෙන් අදාළ ප්‍රාදේශීය සභාවේ ලේකම් ද,

වාහන නවතා තැබීම සඳහා වන පොදු ස්ථානය හා වාහන නතර කර රඳවා තැබීම තහනම් කරන ලද ස්ථානය යන්නෙන් ප්‍රාදේශීය සභාවේ යෝජනා සම්මුතියක් මගින් කරනු ලබන ස්ථානයක් ද අදහස්වේ.

### වයඹ පළාතේ පළාත් සභාව

### ප්‍රාදේශීය සභා සීමාව තුළ මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

මෙම අතුරු ව්‍යවස්ථාව කොබෙයිගනේ ප්‍රාදේශීය සභා සීමාව තුළ මදුරුවන්, රෝග කාරක කෘමීන් බෝවීම මර්ධනය කිරීම හා විනාශ කිරීම මගින් බල ප්‍රදේශයේ පාරිසරික තත්වය වැඩි දියුණු කිරීම සහ බෝවන රෝග පැතිරීයාම වැළැක්වීම සඳහා පනවනු ලැබේ.

02. මෙම අතුරු ව්‍යවස්ථාව අනුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් පුද්ගලයෙකු හෝ තැනැත්තෙකු විසින් කිසිදු ස්ථානයක මදුරුවන් හෝ රෝග කාරක කෘමීන් වර්ධනය වීමට තුඩු දෙන පරිදි කටයුතු කිරීම, කරවීම හෝ එසේ කටයුතු කිරීමට ඉඩ හැරීම හෝ නොකළ යුතුය.

03. මදුරුවන් හා රෝග කාරක කෘමීන් විනාශ කිරීම සඳහා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සෑම ස්ථානයකම පදිංචිකරුවන් විසින්,

1. සියලු නොවැසූ ටින්, බෝතල්, පෙට්ටි, ප්ලාස්ටික් කෑන්, ඉවත දැමූ ටයර්, පොල්කටු, පොල් කෝම්බ සහ ජලය රැස්ව රඳා පැවතීමට ආධාර විය හැකි ස්ථාන ඒ ස්ථානයේ ඇති වෙනත් යම් ජලය රඳා පැවතිය හැකි භාණ්ඩ, ද්‍රව්‍ය, භාජන ආදිය ඉවත් කරවීමට හෝ අන්‍යාකාරයකින් හෝ සාර්ථක ලෙස බැහැර කර දැමීමට සැලැස්විය යුතුය.

2. නේවාසික හෝ නේවාසික නොවන ස්ථාන වල, ගොඩනැගිලි වල, වැහිපිහිලි පහතට වැටෙන පයිප්ප, වැනි ඉදි කිරීම් වල සහ ගෙවතු වල ඇති කාණුවල ජලය බැස යාම ක්‍රමවත්ව පවත්වා ගෙන යා යුතුය. ඒවායේ අවහිර කම් නිරන්තරයෙන් පරීක්ෂා කර බලා ඉවත් කළ යුතුය.

3. නේවාසික හෝ නේවාසික නොවන ස්ථාන වල ඇති සියලුම ජල බඳුන්, ටැංකි සහ ජලය එක්රැස් කරන වෙනත් භාජන මනා තත්වයෙන් යුතුව හා කාලීන ප්‍රතිසංස්කරණයන් සහිතව පවත්වා ගෙන යාමට ද, ඒවා මදුරුවන්ගෙන් හා කෘමීන්ගෙන් ආරක්ෂා වන පරිදි වසා තැබීමට හෝ ආවරණය කර තිබීමට ද, නැතහොත් ඒවායේ මදුරුවන්, කෘමීන් බෝවීම වැළැක්වෙන තත්වයකින් තබා ගැනීමට ද, ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියෙකුට පරීක්ෂා කර බැලීමේ කාර්යය සඳහා සහ මදුරුවන්, කෘමි සතුන් බෝවීම වැළක්වීම සඳහා අවශ්‍ය විය හැකි කටයුතු කරගෙන යාම සඳහා ද, ඒවාට පහසුවෙන් සහ ආරක්ෂා සහිතව යා හැකි ප්‍රවේශයන් ඇති කිරීමට ද, කටයුතු කළ යුතුය.

04. ඉඩම්වල ඇති සියලුම ළිං යහපත් තත්වයෙන් පවත්වාගෙන යා යුතු අතර, මදුරුවන් හා රෝග කාරක කෘමීන් බෝ නොවීම පිණිස වසා හෝ ආවරණය කර තැබීම හෝ මදුරුවන්, රෝග කාරක කෘමීන් බෝවීම වළක්වන තත්වයෙන් තබා ගැනීමට අවශ්‍ය කටයුතු සැලැස්විය යුතුය.

05. හිස් කිරීමට හැකි වන ආකාරයෙන් සාදා ඇති යම් කෘත්‍රිම පොකුණක් වේ නම්, එය යටත් පිරිසෙයින් සතියකට එක් වරක්වත් හිස් කොට පවිත්‍ර කළ යුතුය.

06. ගෙවතුවල හා ඉඩම් වල ඇති කාණු වලින් බැස යන ජලය එකතු වීමෙන් දිය කඩිති සෑදීම වැළැක්වීම සඳහා ඒවා නිතිපතා නඩත්තු කළ යුතුය.

07. ආහාර පිණිස හෝ අලංකාරය සඳහා වවනු ලබන පැළෑටි හැර අනෙකුත් සියලුම ලඳු කැළෑ, වගා සහ වෘක්ෂලතා ආදිය මනුෂ්‍ය වාසස්ථානයක් වශයෙන් භාවිතා කරන යම් ගොඩනැගිල්ලක හෝ ඉදි කිරීම සිට මීටර් 05ක අර්ධ විශ්කම්භයක් ඇතුළත වූ සෑම කොටසකින් ම ඉවත් කරනු ලැබිය යුතුය.

08. සියලුම ගල් වලවල්, මැණික් ගැරු වලවල්, මැටි වලවල් හෝ වෙනත් ඕනෑම කරුණක් හෝ සඳහා තනන ලද වලවල් ඒවායේ වතුර එකතු වීම වළවක්වන ආකාරයෙන් පවත්වාගෙන යා යුතුය.

09. දිය පරඬැල්, පෙඳපාසි, තෙල්පාසි, බරවා පාසි යනුවෙන් සාමාන්‍යයෙන් හඳුන්වනු ලබන ජලජ පැලෑටි හෝ මදුරුවන් හා කෘමීන් බෝවීමට ඉඩකඩ සලසන බවට කලින් කළ දැන ගන්නට ලැබෙන වෙනත් යම් ජලජ පැළෑටියක් හෝ පැලෑටි ඉවත් කොට විනාශ කර දැමිය යුතුය.

මෙම අතුරු ව්‍යවස්ථාවෙහි ඉහත (09) අනු වගන්තියේ සඳහන් කරන ලද පැලෑටි යම් දිය මාර්ගයක් දිගේ පාවී යාම නවත්වන පරිදි සුදුසු බාධක ඉදි කිරීමෙන් ඒවා පැතිරීම වළක්වා ලිය යුතුය.

10. වැසිකිළි, දියවලවල්, දිය උරන වළවල්, මුද්‍රා තැබූ වලවල් හා ඒවායේ වටපිටාව ද ඇතුළුව ස්ථානයේ ඇති සියලු වැසිකිළි මදුරුවන් බෝවීම වලක්වන තත්වයෙන් පවත්වාගෙන යා යුතුය.

04. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් හෝ තත් කාර්යය සඳහා පොදුවේ හෝ විශේෂයෙන් ලිඛිතව බලය දෙන ලද යම් නිලධාරියෙකු විසින් හෝ ඕනෑම දිනයක පෙ. ව. 6.00 සිට ප.ව. 6.00 ඇතුළත යම් වේලාවක දී යම් ස්ථානයකට ඇතුල් වී පහත දැක්වෙන කරුණු සහතික කර ගැනීම පිණිස ඒ ස්ථානය පරීක්ෂා කර බැලීම නිත්‍යානුකූල වන්නේය.

1. ඒ ස්ථානය මදුරුවන් හා කෘමීන් ගැවසෙන ස්ථානයක් ද යන වග,

2. ඒ ස්ථානයේ පදිංචිකරුවන් විසින් අතුරු ව්‍යවස්ථාවල තිබෙන නියමයන් පිළිපැද තිබේ ද ? යන වග,

3. ඒ ස්ථානයේ මදුරුවන් බෝවීම වැළැක්වීම සඳහා සහ විනාශ කිරීම සඳහා යම් පියවර ගැනීම අවශ්‍යවේ නම් එම පියවර මොනවා ද ? යන වග හා,

4. ඒ ස්ථානයේ කෘමි නාශක ඉසීම සාර්ථක ලෙස කර තිබේ ද ? යන වග,

5.1 සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් තත් කාර්යය සඳහා විශේෂයෙන් හෝ පොදුවේ ලිඛිතව බලය දෙන ලද යම් නිලධාරියෙකු විසින් යම් ස්ථානයක් අවශ්‍ය වෙයැයි සලකනු ලබන පරීක්ෂණයකින් පසු, එකී ස්ථානයේ මදුරුවන් හෝ රෝග කාරක කෘමීන් විනාශ කිරීමට හා වර්ධනය වීම මැඩපැවැත්වීමට අවශ්‍ය කාර්යයන් ඉටු කරන ලෙස ලිඛිත දැන්වීමකින් ඒ ස්ථානය අයිතිකරුට හෝ පදිංචිකරුට නියම කරනු ලැබිය හැකිය.

2. මෙම අතුරු ව්‍යවස්ථාවේ ඉහත (01) වගන්තිය යටතේ දැන්වීමක් භාර දෙන ලද යම් ස්ථානයක අයිතිකරු විසින් හෝ පදිංචිකරු විසින් ඒ දැන්වීමේ නිශ්චිත ව සඳහන් කර ඇති කාලය තුළ දී එකී නියමයන් ඉටු කරනු ලැබිය යුතුය.

06.1 සභාපතිවරයාගේ ලිඛිත අනුමැතිය ඇතිව සහ ඒ ස්ථානයෙහි මදුරුවන් හා රෝග කාරක කෘමීන් බෝවීම වැළැක්වීම සඳහා නිලධාරියා විසින් දෙනු ලබන උපදෙස් වලට අනුකූලව හැර යම් ස්ථානයක අයිතිකරු විසින් හෝ පදිංචිකරු විසින් එහි යම් ළිඳක් තැනීම හෝ ටැංකියක්, පොකුණක්, ජල භාජනයක් වතුර මලක් හෝ වතුර රඳවා තබන වෙනත් ස්ථිර භාජනයක් ඉදි කිරීම හෝ නොකළ යුතුය.

2. මෙම අතුරු ව්‍යවස්ථාවේ ඉහත (01) වැනි වගන්තියේ සඳහන් විධිවිධාන වලට පටහැනි වන සේ එම වගන්තියේ සඳහන් ඉදිකිරීමක් කරනු ලැබූ අවස්ථාවක, සභාපතිවරයා විසින් එම ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු වෙත භාරදෙනු ලැබූ ලිඛිත දැන්වීමක් මගින් එම දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලැබූ කාලයක් තුළ දී ළිඳ, පොකුණ, ජල භාජනය, වතුර මල හෝ භාජනය ගොඩනැගිලි ඉදි කිරීමේ මතුපිට නියම කරනු ලබන ද්‍රව්‍යයෙන් පුරවා වසා දමන ලෙස හෝ අන්‍යාකාරයකින් විනාශ කර දමන ලෙස නැතහොත්, ඒ කාලය ඇතුළත ඒ දැන්වීමේ සඳහන් කර ඇති ආකාරයට එය වෙනස් කරන ලෙස නියම කළ හැකි වන්නේය.

07.1 05 හෝ 06 වන අතුරු ව්‍යවස්ථාවක් යටතේ දැන්වීමක් යම් ස්ථානයක අයිතිකරුට හෝ පදිංචිකරුට බාර දීමේ දී පෞද්ගලිකව භාර දීමෙන් හෝ එම දැන්වීම එකී ස්ථානයේ හොඳින් පෙනෙන තැනක ඇලවීමෙන් හෝ ක්‍රියාත්මක කළ හැකිය.

2. යම් ස්ථානයක සම අයිතිකරුවන් දෙදෙනෙකු හෝ ඊට වැඩි ගණනක් විසින් හවුලේ අධිවාසය කරන අවස්ථාවක එම අයිතිකරුවන්ගෙන් එක් එක් අයිතිකරුවෙකු 7(01) වැනි අතුරු ව්‍යවස්ථාවේ නියමයන් සහ 05 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඔවුන් අතරින් යම් අයෙකුට භාර දෙනු ලබන යම් දැන්වීමක නියමයක් ඉටු කිරීම සම්බන්ධව යම් පැහැර හැරීමකට හෝ ඉටු නොකර සිටීමකට පොදුවේ සහ වෙන් වෙන් ව වගකිව යුතුය.

03. 05 වැනි හෝ 06 වැනි අතුරු ව්‍යවස්ථා යටතේ දැන්වීමක් භාර දෙනු ලැබූ යම් ස්ථානයක අයිතිකරු විසින් හෝ පදිංචිකරු විසින් එම දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති කාලය තුළ ඒ දැන්වීමේ නියමයන් ඉටු කිරීම අතපසු කරන හෝ ඉටු නොකරන අවස්ථාවක සභාපතිවරයා විසින් හෝ ඒ දැන්වීම නිකුත් කරනු ලද නිලධාරියා විසින් හෝ තත් කාර්යය සඳහා බලය පවරන ලද යම් නිලධාරියෙකු විසින් ඕනෑම දිනයක පෙ. ව. 6.00 සිට ප.ව. 6.00 අතර, වේලාවක අවශ්‍ය විය හැකි සහායකයින් සහ සේවකයින් සමග එකී ස්ථානයට ඇතුල් වී ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති කටයුතු හෝ පියවර ක්‍රියාත්මක කිරීමට හෝ ක්‍රියාත්මක කරවීම හෝ ක්‍රියාත්මක කිරීමට සැලැස්වීම කරනු ලැබිය හැකිය.

02.1 සභාපතිවරයා විසින් නිකුත් කරන ලද විධිමත් බලපත්‍රයක් යටතේ මිස කිසිම තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ හෝටලයක්, ලැගුම් නිවාසයක්, හෝ නවාතැන්පලක් පවත්වාගෙන යාම නොකළ යුතුය.

04. යම් ස්ථානයක අයිතිකරු හෝ පදිංචිකරු වෙත 5 වැනි , 6 වැනි සහ 7 වැනි අතුරු ව්‍යවස්ථාවන් යටතේ බාර දෙන ලද දැන්වීමක නිශ්චිතව සඳහන් යම් කටයුත්තක් හෝ පියවරක් සභාපතිවරයා විසින් හෝ බලය පවරනු ලැබූ නිලධාරියෙකු විසින් ක්‍රියාත්මක කළ විට හෝ ඉටු කළ විට ඒ කටයුතු හො 'පියවර ක්‍රියාත්මක කිරීමෙහිලා හෝ ඉටු කිරීමෙහි දරන්නට, සිදුවූ වියදම් ප්‍රමාණය, එකී ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු විසින් සභාපතිවරයා වෙත ගෙවිය යුතුය. සභාපතිවරයා සිය අත්සන යටතේ ඒ පිළිබඳ ලියවිල්ලකින් කරනු ලබන ඉල්ලීමකින් පසු දින 14ක් ඇතුළත ඒ මුදල අයිතිකරු හෝ පදිංචිකරු විසින් ගෙවනු ලැබිය යුතු අතර, එසේ ගෙවනු නොලැබුවහොත් එය කොබෙයිගනේ ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු දඩ මුදලක් ලෙස ඒ අයිතිකරුගෙන් හෝ පදිංචිකරුවන් අයකරනු ලැබීම නිත්‍යානුකූල වන්නේය.

08. මෙම අතුරු ව්‍යවස්ථා වලින් කිසිවක් යටතේ සිය කාර්යය නිත්‍යානුකූල ලෙස ක්‍රියාත්මක කිරීමේ දී කිසිදු තැනැත්තෙකු විසින් දැන දැන ම හෝ හිතාමතා සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියාට අවහිර කිරීම හෝ බාධා කිරීම නොකළ යුතුය.

09. මෙම අතුරු ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීම පිළිබඳ ප්‍රාදේශීය සභා පනතේ 122(02) වගන්තිය ප්‍රකාරව කටයුතු කිරීම නිත්‍යානුකූල වන්නේය.

10. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම අතුරු ව්‍යවස්ථාවල :-

''අයිතිකරු'' යන්නෙන් යම් අයිතිකරුවෙකු සහ බදු කරුවෙකු ද, යම් ස්ථානයක කුළියට හෝ එළදාවට කවර හෝ ආකාරයක අයිතියට හිමිකම් ඇති යම් තැනැත්තෙකු ද,

''පදිංචිකරු'' යන්නෙන් යම් ස්ථානයක පදිංචිව සිටින්නා වූ හෝ තමා වෙනුවෙන් හෝ තවත් අයෙකු වෙනුවෙන් නියෝජිතයන් වශයෙන් හෝ එහි භාරකාරිත්වය, කළමණාකරණය හෝ පාලනය දරන තැනැත්තෙකු, නමුත් නවාතැන්කරුවෙකු නොවන අයෙක් ද,

''බලයලත් නිලධාරියා'' යන්නෙන් අදාළ සභාපතිවරයා විසින් ලිඛිතව බලය පවරනු ලැබූ එම සභාවේ යම් නිලධාරියෙකු ද, සේවකයෙකු ද,

''සභාව'' යන්නෙන් අදාළ කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව ද,

''සභාපති'' යන්නේ අදාළ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද,

''ස්ථානයක්'' යන්නෙන් යම් ඉඩමක්, නිවසක්, ගොඩනැගිල්ලක් හෝ ඉදි කිරීමක් ඇතුළත් වන අතර, යම් පොකුණක්, ටැංකියක් වැවක ජලය මාර්ගයක, කාණුවක හා ගඟක නිම්නය ද අදහස්වේ.

## වයඹ පළාතේ පළාත් සභාව

### ප්‍රාදේශීය සභා සීමාව තුළ පාරවල් සහ මංමාවත් සැරසිළි කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

මෙම අතුරු ව්‍යවස්ථාව කොබෙයිගනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පොදු ස්ථාන මංමාවත්, පාරවල්, සැරසිළි කිරීම මගින් පරිසරයට සිදුවන හානි වැළැක්වීමක් මහජනතාවට සිදුවන අවහිරතා වැළැක්වීම විධිමත් කිරීමක්, පාලනය කිරීම හා පරිපාලනය කිරීම සඳහා පනවනු ලැබේ.

02. කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව විසින් ඒ සඳහා නිකුත් කරන ලද අවසර පත්‍රය මත මිස කිසිම තැනැත්තෙකු විසින් ප්‍රදේශයේ කවර හෝ යම් පොදු ස්ථානයක මංමාවතක, පාරක කිසියම් ආකාරයකින් හෝ සැරසිළි කිරීම නොකළ යුතුය.

03. දෙවන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් අවසර පත්‍රය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලබන සෑම අයදුම්පත්‍රයක්ම මෙහි අංක 01 උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූලව සකස් කර ඉදිරිපත් කළ යුතුය.

04. ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලුම්පත්‍රයක්ම සැරසිළි කිරීම ආරම්භ කිරීමට අදහස් කරන දිනට යටත් පිරිසෙයින් දින 03කට කලින් සභාපති හෝ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ වුව ද මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කොට ඇති කාල සීමාව ඇතුළත වුව ද ඉදිරිපත් කරනු නොලැබූ එවැනි ඉල්ලුම්පත්‍රයක් විශේෂ අවස්ථානුගත කරුණු යටතේ සලකා බලා සභාපති හෝ ලේකම් විසින් ලබා ගෙන ඒ සම්බන්ධයෙන් කටයුතු කළ හැකිය.

05. ඉහත කී පළමුවන උපලේඛනයෙහි ඇතුළත් ඉල්ලුම්පත්‍රයෙහි සඳහන් සියලුම විස්තර ද, ඊට අමතරව ඉල්ලුම්පත්‍ර සම්බන්ධයෙන් තීරණය කිරීම සඳහා සභාපති හෝ ලේකම් විසින් ඉල්ලා සිටිනු ලබන වෙනත් යම් තොරතුරු ද, ඇත්නම්, ඒ සියලු විස්තර ද, සෑම ඉල්ලුම්කරුවෙකු විසින්ම සැපයිය යුතුය.

06. සභාව විසින් කරුනු ලබන සෑම අවසර පත්‍රයක්ම

1. මෙහි 2 වැනි උපලේඛනයෙහි ඇති ආකෘතියෙහි ප්‍රකාර විය යුතුය.
2. එකී අවසර පත්‍රය යම් අත්හිටුවීමකට හෝ අවලංගු කිරීමකට යටත්ව නිකුත් කරනු ලැබූ කාර්යය සහ කාලය සඳහා පමණක් වලංගු විය යුතුය.
3. අවසරලාභියා විසින් කරනු ලබන සියලුම සැරසිළි අදාළ මංමාවත් වල ගමන් කරනු ලබන පුද්ගලයෙකු හෝ පුද්ගල කණ්ඩායමක හෝ ධාවනය කරනු ලබන කවර හෝ වාහනයක ගමනාගමනයකට බාධා වන පරිදි නොකළ යුතුය.

08. කරනු ලබන සැරසිළි කිසියම් පුද්ගලයෙකුට, පුද්ගල කණ්ඩායමකට සෘජුව හෝ වක්‍රව අපහාස වන අයුරින් නොවිය යුතුය.

09. පහත සඳහන් කරුණු ගැන එනම්,

1. නිකුත් කරනු ලබන අවසර පත්‍රය මෙම අතුරු ව්‍යවස්ථාවල සඳහන් යම් කිසි විධානයක් කඩ කිරීම සඳහා යොදා ගනු නොලබන බවට,
2. අවසර පත්‍රය මගින් අවසර ලැබුණ ක්‍රියා නිසා මිනිසාට හෝ පරිසරයට හෝ පොදු දේපළ වලට අලාභ හෝ හානි හෝ යම් උපද්‍රවයක් හෝ සිදු නොවන බවට හා
3. පරිසරය ආරක්ෂා කිරීම සඳහා ඉල්ලුම්කරු විසින් ප්‍රමාණවත් පියවර ගෙන ඇති බවට සෑහීමකට පත් වුවහොත්, පමණක් අදාළ අවසර පත්‍රය නිකුත් කළ යුතුය.

10.1 බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා ගාස්තු වශයෙන් සභාව විසින් කලින් කළ යෝජනා සම්මුතියක් මගින් සම්මත කරනු ලබන ගාස්තු ප්‍රමාණයක් අයකළ හැකිය. එම ගාස්තු ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කළ යුතුය.

2. අවසර පත්‍රයක් නිකුත් කරනු ලබන අවස්ථාවේ අවසරපත්‍රලාභියා කරනු ලබන සැරසිළි ප්‍රමාණය පදනම් කරගෙන තැන්පත් මුදලක් සභාවේ තැන්පත් කළ යුතුය. එම තැන්පත් මුදල් සභාව විසින් කලින් කලට යෝජනා සම්මුතියක් මගින් තීරණය කළ හැකිය.

11.1. අවසරපත්‍රලාභියා විසින් කරනු ලැබූ සැරසිළි නියමිත කාලය තුළ ඉවත් කරනු නොලැබුවහොත් සැරසිළි සභාව විසින් ඉවත් කිරීමට ද, ඒ සඳහා සභාවට වැය වන මුදල ආවරණය කිරීම සඳහා අවසරපත්‍රලාභියා විසින් තැන්පත් කළ මුදල සභා අරමුදලට බැර කරනු ලැබීම ද, නිත්‍යානුකූල වන්නේය.

2. අවසරපත්‍රලාභියා විසින් නියමිත කාලය තුළ සැරසිළි ඉවත් කරනු ලැබීමෙන් පසු හා තැන්පත් මුදල ආපසු ලබා ගැනීම සඳහා මාස 06ක් ඇතුළත ඉල්ලීමක් ඉදිරිපත් නොවුනහොත්, එකී තැන්පත් මුදල සභා ආදායමට බැර කළ යුතුය.

12. අවසරපත්‍රලාභියා විසින් මාර්ග දෙපස ඉඩම්වල ඇති දේපළකට හෝ එම මංමාවත් වල ගමන් කරනු ලබන යම් පුද්ගලයෙකුට, පුද්ගල කණ්ඩායමකට හෝ දේපළකට අවහිර වන හෝ හානි වන ආකාරයට සැරසිළි නොකළ යුතු අතර, එමගින් යම් හානියක් සිදුවුවහොත්, එම හානිය සම්බන්ධව වගකීම් අවසරපත්‍රලාභියා විසින් දැරිය යුතුය.

13. සැරසිළි කිරීමේදී ඉවතලන සියලුම ද්‍රව්‍ය පරිසරයට හානි නොවන ආකාරයට බැහැර කිරීම අවසරපත්‍රලාභියාගේ වගකීමක් වන්නේය.

14. සැරසිළි කිරීම සඳහා සභාව විසින් නිකුත් කරනු ලබන අවසර පත්‍රය සභාවේ බලයලත් නිලධාරියෙකු හෝ පොලිස් නිලධාරියෙකු විසින් පරීක්ෂා කිරීම පිණිස ඉල්ලා සිටින විටක දී ඉදිරිපත් කිරීම කළ යුතු වන්නේය.

15. අවසර පත්‍රයෙහි සඳහන් වන පරිදි එහි සැරසිළි ඉවත් කළ යුතු දිනය හා වේලාව නොඉක්මවන පරිදි සැරසිළි ඉවත් කිරීමට අවසරපත්‍රලාභියා කටයුතු කළ යුතු වන්නේය.

16. මෙම අතුරු ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම පිළිබඳ ඒ උල්ලංඝණය ස්ථාපිත වන යම් එක් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සඳහා නිසි බලය ඇති අධිකරණයක් විසින් ඒ ගැන වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝණය ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ බලය දෙනු ලැබූ වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් බාරදෙනු ලැබීමෙන් පසුව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) වගන්තිය ප්‍රකාරව දඬුවමකට යටත්වේ.

පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස :- මෙම අතුරු ව්‍යවස්ථාවල

"සැරසිල්ලක්" යන්නෙන් ස්වභාවික, කෘත්‍රිම හෝ ඕනෑම ද්‍රව්‍යයකින් සහ ආලෝක සංඥා මගින් කරනු ලබන කිනම් හෝ ආකාරයක සැරසිල්ලක් අදහස්වේ.

"තැනැත්තෙකු" යන්න යම් පුද්ගලයෙකු, පුද්ගල කණ්ඩායමක්, යම් ආයතනයක්, යම් සංවිධානයක් ද,

"පාරවල් මංමාවත්" යනුවෙන් (193) වැනි අධිකාරිය වන) මංමාවත්, ආඥා පනතේ පිළිවෙලින් ඒවාට දී ඇති අර්ථය ද,

**පොදු දේපළ** යන්නෙන් අදාළ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සියලුම පාරවල් සහ මංමාවත් දෙපස පිහිටියා වූ දුරකථන හා විදුලි කණු ද, මහජනයා පොදුවේ භාවිතා කරන සියලුම ස්ථාන හා දේපල ද,

**පොලිස් නිලධාරියා** යන්නෙන් පොලිස් නිල ඇඳුමින් සැරසුන ශ්‍රී ලංකා පොලිස් සේවයේ නිලධාරියෙකු ද,

**බලයලත් නිලධාරියා** යන්නෙන් අදාළ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පැවරූ සභාවේ නිලධාරියෙකු ද,

**ලේකම්** යන්නෙන් ප්‍රාදේශීය සභාව සඳහා පත් කරන ලද ලේකම්වරයා ද,

**සභාව** යන්නෙන් අදාළ ප්‍රාදේශීය සභාව ද,

**සභාපති** යන්නෙන් කොබෙයිගනේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද, අදහස් වේ.

## 01 වැනි උපලේඛනය

### පාරවල් හා මංමාවත් සැරසිළි කිරීමට අවසර පත්‍රයක් ලබා ගැනීම සඳහා අයදුම්පත්‍රය

01. අයදුම්කරුගේ නම :-
02. අයදුම්කරුගේ ලිපිනය :-
03. අයදුම්කරුගේ දුරකථන අංකය :-
04. අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය :-
05. සැරසිළි කරන වීථිය හෝ පෙදෙස හඳුන්වනු ලබන නාමය :-
06. සැරසිළි කිරීමට යෝජිත දිනය :-
07. සැරසිළි කිරීමට යොදා ගන්නා ද්‍රව්‍ය :-
08. සැරසිළි ඉවත් කරනු ලබන දිනය :-
09. අපද්‍රව්‍ය බැහැර කිරීමට යොදා ගන්නා ක්‍රියා මාර්ගය:-

ඉල්ලුම්කරුගේ අත්සන

පරීක්ෂා කළෙමි. මීටර්/වර්ග මීටර් ............... ක් සැරසිළි කිරීම සඳහා ගාස්තුව වශයෙන් රු................................ ක් අයකර ගැනීම නිර්දේශ කරමි.

ආ.ප. බලයලත් නිලධාරි

## 02 වැනි උපලේඛනය

### පාරවල් හා මංමාවත් සැරසිළි කිරීම සඳහා අවසරපත්‍රය

01. අයදුම්කරුගේ නම :-
02. අයදුම්කරුගේ ලිපිනය :-
03. අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය :-
04. සැරසිළි කරන වීථිය හෝ පෙදෙස :-
05. සැරසිළි කිරීමට යෝජිත දිනය :-
06. සැරසිළි ඉවත් කළ යුතු දිනය :-

ගාස්තු ගෙවන ලද දිනය : —————— මුදල රු. ——————
බිල්පත් අංකය ——————
කොන්දේසි හා අනුමැතිය ——————

ඉහත විස්තර හා කොන්දේසි සැළකිල්ලට ගනිමින් අදාල මාර්ගයේ සැරසිළි කිරීමට අනුමත කරමි.

සකස් කළේ පරීක්ෂා කළේ අනුමත කළේ.

## වයඹ පළාත් සභාව

### ලැගුම් නිවාස හා නවාතැන්පළවල් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

කොබෙයිගනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනත යටතේ ලියාපදිංචි කර ඇත්තාවූ හෝ එවැනි ලියාපදිංචියකින් තොරව හෝ පවත්වාගෙන යනු ලබන හෝටල්, ලැගුම් නිවාස හා නවාතැන් පලවල් විධිමත් කිරීම පිණිස මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ.

02. 1 සභාපතිවරයා විසින් නිකුත් කරන ලද විධිමත් බලපත්‍රයක් යටතේ මිස කිසිම තැනැත්තෙකු විසින් කොබෙයිගනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ හෝටලයක්, ලැගුම් නිවාසයක් හෝ නවාතැන්පලක් පවත්වාගෙන යාම නොකළ යුතු ය.

2. මෙම අතුරු ව්‍යවස්ථාවේ පළමුවන ඡේදය යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක් සඳහා සභාව විසින් *ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ගාස්තුවක් ගෙවිය යුතුය. වලංගු කාලය සභාව විසින් කලින් අවලංගු කරන ලද්දේ නම්, මිස එය නිකුත් කල වර්ෂයේ දෙසැම්බර් 31 වැනි දිනයෙන් අවසන් විය යුතු ය.

3. සභාව විසින් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් ම මෙහි 2 වැනි උපලේඛනයේ ඇති ආකෘති ප්‍රකාර විය යුතු ය.

03. ඉහත 02 (1) අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක ම ලැගුම් නිවාසයක, හෝටලයක හෝ නවාතැන්පළක ඇති තනි කාමර සහ යුගල කාමර සංඛ්‍යාව වෙන වෙනම සඳහන් කළ යුතු අතර , ලැගුම් නිවාසයෙ හි හා නවාතැන්පලෙ හි ලැගුම් පහසුකම් සලසනු ලැබිය හැකි උපරිම නවාතැන්කරුවන් සංඛ්‍යාව ද, සඳහන් කළ යුතු ය.

04. ඉහත 02(1) අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක් ලබා ගැනීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථාවල ‘1’ උපලේඛනයට සාරානුකූලව පිළියෙල කරන ලද අයදුම්පත්‍රයක්, ගොඩනැගිල්ලේ සැලැස්ම සමග සභාපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

05(1) ලැගුම් නිවාසයක නවාතැන් ගැනීම සඳහා මෙහි අංක 06 සිට 13 දක්වා වූ අතුරු ව්‍යවස්ථාවල සඳහන් කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස කිසිම තැනැත්තෙකුට බලපත්‍රයක් ලබාගැනීම සඳහා හිමිකම් නොලැබේ.

02. බලපත්‍රයක් ලබා ගැනීම සඳහා වූ ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරන ලබන්නේ නම්, එයට හේතු වූ කරුණු අයදුම්පත්‍රය ලැබී සති 06ක් තුළ සභාපතිවරයා විසින් ඉල්ලුම්කරුට ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතුය.

06.1. පරිශ්‍රය පොදු පාරකට මුහුණලා පිහිටා නොතිබේ නම්, එයට පිවිසීම සඳහා සුදුසු ප්‍රවේශ මාර්ගයක් තිබිය යුතුය.

2. ගොඩනැගිල්ල ශක්තිමත් ලෙස සාදා තිබිය යුතු අතර, යහපත් තත්වයකින් නඩත්තු කරනු ලැබිය යුතුය.

3. වහළ ස්ථිර හා කල් පවත්නා ද්‍රව්‍ය වලින් තනා තිබිය යුතුය.

4. ගොඩනැගිල්ල තුළ එකතු වන කසළ දිනපතා ඉවත් කිරීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කළ යුතුය.

07.1 නවාතැන්කරුවෙකු සඳහා වෙන් කර ඇති කාමරයක ගෙබිමේ අවම වර්ග ප්‍රමාණය වර්ග අඩි 90ක් විය යුතු අතර, එක් තැනැත්තෙකුට වැඩි සංඛ්‍යාවක් සඳහා නිදා ගැනීමේ පහසුකම්

සලසනු ලබන කාමරයට එක් තැනැත්තෙකු වෙනුවෙන් වෙන් කළ ප්‍රමාණය වර්ග අඩි 60කට නොඅඩු විය යුතු ය.

2. සෑම කාමරයකම වාතාශ්‍රය සහ ආලෝකය ලබා ගැනීම සඳහා විවෘත කළ හැකි ජනෙල් සවි කළ යුතුවේ. ජනෙල් විවෘත කළ විට එක් එක් ජනේලයේ වර්ග ප්‍රමාණය කාමරයේ ගෙබිම් වර්ග ප්‍රමාණයෙන් 1/5ට නොඅඩු විය යුතුය.

3. සෑම කාමරයකම බිත්ති උසින් අඩි 10ට නොඅඩු විය යුතුය.

4. ගෙබිම ජලය උරා නොගන්නා හා කාන්දු නොවන ද්‍රව්‍යයකින් සාදා තිබි යුතුය.

5. එක් එක් කාමරයේ නවාතැන් ගන්නා තැනැත්තන් සංඛ්‍යාව අනුව ප්‍රමාණවත් ඇඳන් සංඛ්‍යාවක් සහ පුටු සංඛ්‍යාවක් ද, මේසයක්, කුඩා රාක්කයක්, හා කණ්නාඩියක් ද සපයා තිබිය යුතුය.

6. සෑම ඇඳකටම මදුරු දැළක් සපයනු ලැබිය යුතුය.

06-223

## විවිධ දැන්වීම්

**සංශෝධනයයි**

**කුලියාපිටිය නගර සභාව**

**2011 වර්ෂය සඳහා ව්‍යාපාර/කර්මාන්ත බද්ද පැනවීම සංශෝධනය කිරීම**

255 වැනි අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 165(ආ) වැනි වගන්තියෙන් නගර සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාරව, කුලියාපිටිය නගර සභාව 2011 වර්ෂයට ව්‍යාපාර/කර්මාන්ත බද්ද පැනවීම සඳහා 2011.01.07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* IV(ආ) පළාත් සභා කොටසේ පළකරන ලද 2011 වර්ෂය සඳහා ව්‍යාපාර/කර්මාන්ත බද්ද පැනවීම යටතේ ඇති උපලේඛනයේ 1 වැනි තීරුවේ 6 වන වගන්තිය මෙහි පහත පරිදි සංශෝධනය විය යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

| *1 වැනි තීරුව* | *11 තීරුව* |
|---|---|
| 6. රු. 1,50,000 ඉක්මවන අවස්ථාවක | 3,000 0 |

ඒ. එම්. ලක්ෂ්මන් අදිකාරි,
සභාපති,
කුලියාපිටිය නගර සභාව.

2011 මැයි මස 26 වැනි දින,
කුලියාපිටිය නගර සභා කාර්යාලයේ දී ය.

06-237

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.